# එළවළු අලෙවියට අනදියහැකි මං

විශාල ප්‍රමාණයෙන් එළවළු වගා කෙරෙන උඩරට පළාත්වලින් කොළඹට එළවළු ගෙන ඒමත්, ගෙනෙන එළවළු අලෙවි කිරීමත් ඉතාම වැඩි වශයෙන් සිදුවන්නේ පෞද්ගලික අලෙවි සංවිධාන මගිනි. මෙම සංවිධාන සමග තොග වෙළඳ මට්ටමින් තරඟ කිරීම සඳහා ඇත්තේ අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව, සමුපකාර අලෙවි සංගමය වැනි ආයතන කිහිපයකි. එළවළු වෙළෙඳපොළෙහි දී ජාතික මට්ටමේ ආයතන වලට පෞද්ගලික වෙළෙන්ද අභිබවා යාමට තරම් තවම පුළුවන් කමක් ලැබී නැත. එබැවින්, පෞද්ගලික වෙළෙන්ද එළවළු මිල අඩු වැඩි වීම කෙරෙහි බලපාන බලගතු සාධකයක් බවට පත්ව සිටියි. නිෂ්පාදකයාටත් සාධාරණ මිලක් ගෙවන, අතරම පාරිභෝගිකයාටත් සාධාරණ මිලකට එළවළු ලබා ගැනීමට සහ නිෂ්පාදකයා ලබන මිලත්, පාරිභෝගිකයා ගෙවන මිලත් අතරෙහි පරතරය හැකි තරම් දුරට සීමා කිරීමට ද විශේෂයෙන් ම තොග වෙළෙඳ මට්ටමෙහිදී පෞද්ගලික වෙළෙන්ද සමග තරඟ කල හැකි නව නවත් සංවිධාන පිහිටු විය යුතුව ඇත.

## ඒකාබද්ධ අලෙවි ක්‍රමයක්

අලෙවි දෙපාර්තමේන්තුවටත්, සමුපකාරයටත්, පෞද්ගලික වෙළෙඳුන් සමඟ කරට කර තරඟ කල හැකි වනුයේ එළවළු එකතු කරන අවස්ථාවෙහි දී තීරණය වන මිල ගණන් කෙරෙහි බලපෑමක් ඇති කෙරෙන අයුරින් මිල දී ගැනීමට හැකි නම් පමණ ය. බහුලව එළවළු වැවෙන ප්‍රදේශයන්හි එළවළු එකතු කිරීමේ මධ්‍යස්ථාන වැඩි වැඩියෙන් පිහිටුවීමට යථෝක්ත පොදු ආයතන උනන්දුවීම අවශ්‍ය ය.



ගොවි ද්‍රව්‍ය අලෙවියට අනදියහැකි අංශයකි සමුපකාරය

ණය පහසුකම් ආදිය තව තවත් ව්‍යාප්ත කල හොත් නිෂ්පාදකයාත්, සමුපකාරයත් අතර වඩ වඩාත් සමීප සබඳතාවයක් ඇති කර ගැනීමට හැකි වනු ඇත. මෙම සබඳතාවය විධිමත් අන්දමින් පවත්වා ගෙන යාමට නම් සමුපකාර ප්‍රාදේශික, සමුපකාර ග්‍රාමීය බැංකු, එලවළු එක් රැස් කිරීමේ ග්‍රාමීය මධ්‍යස්ථාන ආදිය ඒකරාශි කොට විෂයානුබද්ධ අලෙවි ක්‍රමයක් ඇති කිරීම වැදගත් ය.

සමුපකාර සමිති මගින් නිෂ්පාදකයන්ට ණය පහසුකම් සලසා දෙනු ලැබුව ද, ඔවුන් තම නිෂ්පාදන සමුපකාරය මගින් අලෙවි නොකරන බව පෙනී ගොස් ඇත. සමහර අවස්ථාවල දී සමුපකාරය මගින් එලවළු සඳහා අඩු මිල ගණන් ගෙවීම මීට ප්‍රධාන හේතුව ය. එලවළු සඳහා හොඳ මිලක් ගෙවීමට සමුපකාරයට හැකි වුවහොත් විශාල වශයෙන් එලවළු ලබා ගැනීමට ඊට හැකිවන අතර, එමගින් අලෙවි කටයුතු පුළුල් කිරීමට ද හැකියාවක් ලැබෙනු ඇත. අලෙවි කටයුතු ව්‍යාප්ත වීමත් සමග නිෂ්පාදකයන් අතුරෙන් වඩාත් ධනවත් කොටස ද මෙම අලෙවි සංවිධාන ක්‍රමය යොදා ගැනීම සඳහා පෙළඹිය හැකි ය. එවිට ගොවීන්ගේ ඉතිරි කිරීම් යොදා ගැනීමෙන් සමුපකාර සමිතියට තම ප්‍රාග්ධන සම්පත් වැඩි කර ගැනීමට ද, ණය දීම් සඳහා එම ඉතිරි කිරීම් ලාබදායි අයුරින් යොදා ගැනීමට ද හැකි වනු ඇත.

වත්, වඩ වඩාත් සමීප වුව හොත් පෞද්ගලික වෙළෙන්ද සමග ඉතා හොඳින් තරග කල හැකි වඩාත් ශක්තිමත් අලෙවි සංවිධානයක් ගොඩ නඟා ගැනීමට පුළුවන. තොග වෙළෙඳ පොළේ තත්ත්වය වැඩිදියුණු කිරීමට ද, උසස් මට්ටමක වර්ගීකරණ ක්‍රම, ඇසුරුම් ක්‍රම වැනි වඩාත් යහපත් අලෙවි ක්‍රම සකස් කිරීමට ද, හැකි වනු නිසැකය. මෙවැනි පියවරක ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදකයන්ට එලවළු සඳහා වැඩි මිලක් ලබා ගැනීමට ද සැලසෙනවා ඇත.

කොමිස් නියෝජිතයන් විසින් අධික ලෙස ලාබ ලබා ගැනීම වළක්වා ලීම ද එළවළු අලෙවි කටයුතුවල සුභ සෙත පිණිස හේතු වෙන අතර, වඩාත් විශ්වාසදායක මිල තොරතුරු නිෂ්පාදකයන්තට නිරන්තරයෙන්ම පත් කිරීම මෙහිලා මහෝපකාරී වෙයි. අලෙවි දෙපාර්තමේන්තුව මගින් දැනට දිනපතා ගුවන් විදුලියෙන් ප්‍රචාරය කෙරෙන මිල ගණන් ද ගොවීන්ට සැලකිය යුතු අන්දමින් ප්‍රයෝජනවත් වී තිබේ.

කොළඹ වෙළෙඳ පොළේ තදබදය මඟ හැරවීම පිණිසත්, එලවළු තොග වෙළෙඳ පොලක් අළුතෙන් පිහිටුවීම පිණිසත් රජය මගින් දැනටමත් කටයුතු කර ගෙන යන අතර, නිෂ්පාදනවලට සිදු වන්නා වූ හානියත්, අපතේ යාමත් මෙයින් වලක්වා ගැනීමට හැකි වනු නිසැක ය. නාස්තිය නිසාත් එහා මෙහා කිරීමේ දී භාවිතා

**එළවළු වගාව මෙරට කෘෂිකර්මයෙහි ඉතාම වැදගත් තැනක් ගන්නා අතර, දිවයිනෙහි විශාල පිරිසකගේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට ද පත්ව ඇත. එළවළු නිෂ්පාදනයට සහ අලෙවියට ද අදාළ ගැටළු පිළිබඳව අවබෝධයක් ලබා ගනු වස් ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙහි පර්යේෂණ හා පුහුණු කිරීමේ නිළධාරින් වන ඩබ්ලිව්. ඒ. ටී. අබේසේකර හා එස්. එම්. පී. සේනානායක විසින් කලකට පෙර විශේෂ සමීක්ෂණයක් පවත්වන ලදි, එම සමීක්ෂණයේ දී දැනගන්නට ලැබුණු කරුණුද ඇතුළුව එලවළු අලෙවිය කෙරෙහි දැනට බල පවත්නා බාධක ප්‍රශ්නත්, ඒවාට යෙදිය හැකි පිළියමුත් මේ ලිපියට ඇතුළත්ය.**

## අපතේ යාම වැළැක්විය යුතුයි

සමුපකාරයට එලවළු විශාල වශයෙන් නොලැබීමට හේතු වන තවත් වැදගත් කරුණක් නම් තොග වෙළෙඳ මට්ටමේ දී ඊට සරිලන ප්‍රමාණවත් අන්දමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොවීම ය. අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවට පෙරට වඩා එලවළු අලෙවි කිරීමේ කටයුතුවල යෙදීමට දැන් හැකියාවක් ඇති නිසා ඒ ඒ ප්‍රදේශවලින් එලවළු එක් රැස් කොට දෙපාර්තමේන්තුව මගින් අලෙවි කරවා ගැනීමට සමුපකාර සමිතිවලට පියවර ගත හැකි ය. සමුපකාරයත්, අලෙවි දෙපාර්තමේන්තු-

වෙන අයෝග්‍ය ක්‍රම නිසාත් එලවළු වලින් සැහෙන කොටසක් අපතේ යයි. ගෝවා, බෝංචි, සහ කැරට් වලින් මෙලෙස අපතේ යන ප්‍රමාණය ගණු දෙනු කෙරෙන ප්‍රමාණයෙන් පිළිවෙලින් සියට 25 ක්, සියට 8 ක් සහ සියට 20 ක් පමණ වෙයි.

අස්වනු නෙලීම, වර්ග කිරීම, ඇසිරීම පිළිබඳව වඩාත් දියුණු ක්‍රම ගොවීන්ට හඳුන්වා දීම එලවළු අපතේ යාම වලක්වා ගැනීමට බොහෝ සෙයින්ම හේතුවනවා නිසැකය.